සැ. යු. - 2010.06.04 වැනි දින පළ වූ අංක 1,657 දරන ගැසට් පත්‍රයේ II සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,658 - 2010 ජුනි මස 11 වැනි සිකුරාදා - 2010.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1214 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1215 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1221 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජුනි මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජුනි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# තනතුරු - ඇබෑර්තු

## මොරවැව ප්‍රාදේශීය සභාව

මොරවැව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් ඇති මොරවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| පුස්තකාල සේවක | 01 | රු.11,730-120x10-130x10-145x10 -160x12-රු.17,600 | අටවන ශ්‍රේණිය (නමවන වසර සමත් විය යුතුය) |
| මුරකරු | 01 | රු.13,050-130x10-145x10-160x12-රු.17,600 | අටවන ශ්‍රේණිය (නමවන වසර සමත් විය යුතුය) |
| මාර්ග කම්කරු | 01 | රු.11,730-120x10-130x10-145x10 -160x12-රු.17,600 | අටවන ශ්‍රේණිය (නමවන වසර සමත් විය යුතුය) |
| රියදුරු | 01 | රු.12,470-130x10-145x10-160x10-170x12 රු.18,860 | අටවන ශ්‍රේණිය (නමවන වසර සමත් විය යුතුය) |

02. *අවශ්‍ය සුදුසුකම් :*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.
(iii) අයදුම්කරුවන් මොරවැව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ අවුරුදු 03ක ස්ථිර පදිංචියක් ඇති අයකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කල යුතුය.)
(iv) අයදුම්කරු යහපත් චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(v) දණ්ඩනීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
(vi) මොරවැව ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් ස්වේච්ඡා පදනම මත සේවය කරන සේවකයින් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(vii) අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.
(viii) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය මොරවැව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය.
(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සහිතය.
(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා රජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජය හෝ නැගෙනහිර පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලු සේවකයන් බැඳී සිටිය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු අය තෝරාගැනේ.
(ii) අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය:-
උප්පැන්න සහතිකය ;
අධ්‍යාපන සහතිකය ;
පදිංචිය සනාථ කිරීම පිණිස ඡන්දහිමි නාමලේඛනයේ පිටපත් සහ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය ;
වෘත්තීය හෝ පලපුරුද්ද පිළිබඳ සහතික තිබේ නම් එම සහතික ;
රියදුරු තනතුර සඳහා රියදුරු බලපත්‍රය.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2010 ජූනි 30 වැනි දිනට පෙර හෝ එදිනට ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, මොරවැව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්. ආර්. රම්බණ්ඩා,
සභාපති,
මොරවැව ප්‍රාදේශීය සභාව.

2010ක් වූ අප්‍රේල් මස 30 වැනි දින,
මොරවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***මොරවැව ප්‍රාදේශීය සභාව***

*.............................................. තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :———.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :———.
02. තැපැල් ලිපිනය :———.
03. උපන් දිනය :
වර්ෂය:———. මාසය:———. දිනය:———.
04. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :
අවුරුදු:———. මාස :———. දින :———.
05. විවාහක / අවිවාහක බව : ———.
06. ජාතිය :———.
07. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද ? :———.
එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :———.
08. අධ්‍යාපන සුදුසුකම්: ———.
09. වෘත්තීය සුදුසුකම්:———.
10. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් :
(i) දැනට දරන තනතුර :———.
(ii) එම තනතුරට පත්වූ දිනය :———.
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් /ස්වේච්ඡා පදනම මත ද :———.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දන්වමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

06-138

# පළාත් පාලන නිවේදන

## මහනුවර මහ නගර සභාව

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත
**"පූජ්‍ය ඉඹුල්පිටියේ ධම්මපාල මහා ස්ථවිර මාවත" නම් කිරීම**

2008.12.22 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ දී අංක 8 (64) දරන සභා සම්මුතියට අනුව වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

(252 වැනි අධිකාරිය වන ) මහ නගර සභා ආඥා පනතේ 71(1) යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි මධ්‍යම පළාත් සභාවේ මහ ඇමතිතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත "පූජ්‍ය ඉඹුල්පිටියේ ධම්මපාල මහා ස්ථවිර මාවත" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

චන්දන තෙන්නකෝන්,
මහනුවර නාගරික කොමසාරිස්.

2010 මැයි මස 19 වැනි දින,
මහනුවර නාගරික කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | :- | මහනුවර මහ නගර සභාව |
| 2. | දිස්ත්‍රික්කය | :- | මහනුවර |
| 3. | වීථියේ වර්තමාන නම | :- | නැත |
| 4. | අලුතින් යොදා ඇති නම | :- | "පූජ්‍ය ඉඹුල්පිටියේ ධම්මපාල මහා ස්ථවිර මාවත" |
| 5. | මාර්ග විස්තරය | :- | සංඝරාජ මාවතෙන් ආරම්භ වී රජවාසල උද්‍යානයට යාබදව රජපිහිල්ල මාවතට යාමට මහජනයා භාවිතා කරන අඩි පාර (පැරණි Y.M.B.A.ගොඩනැගිල්ල අසල) වේ. |

06-155

---

## තංගල්ල නගර සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වැනි වගන්තිය යටතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී අමාත්‍යතුමා විසින් 1953 සැප්තැම්බර් මස 25 වැනි දින සාදන ලද හා 1956 ජූනි මස 08 වැනි දින ලංකාණ්ඩුවේ *ගැසට්* පත්‍රයේ IV වැනි කොටසේ පළකරනු ලැබූ නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල 1 වැනි කාණ්ඩයේ සිට XXV වැනි කාණ්ඩය දක්වා සම්මත අතුරු ව්‍යවස්ථාවන්ද XXVII කාණ්ඩයේ සිට XXIX වැනි කාණ්ඩය දක්වා වන සම්මත අතුරු ව්‍යවස්ථාවන් ද, සහ ඉහත එකී පනතේ විධිවිධාන යටතේම, 1975 අගෝස්තු මස 05 දින පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් සාදන ලද හා 1975 සැප්තැම්බර් මස 12 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV වැනි කොටසේ ප්‍රකාශයට පත්කරන ලද XXX වන කාණ්ඩයේ සිට XXXIII වැනි කාණ්ඩය දක්වා වන සම්මත අතුරු ව්‍යවස්ථා තංගල්ල නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ යුතු බවට තංගල්ල නගර සභාව විසින් 2009.10.29 දින පැවැත්වූ මාසික මහා සභාවේ තීරණ අංක 3:9 යටතේ පිළිගැනීමට සහ ඒ අනුව අදාල කටයුතු ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනිල් සෙල්ලාහැන්නදි,
සභාපති,
තංගල්ල නගර සභාව.

2009 දෙසැම්බර් මස 01 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

06-142

---

## රත්තොට ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ, රත්තොට ප්‍රාදේශීය සභාව මගින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත්, රත්තොට ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්ව විසින් යම් විරෝධතාවයක් පලකර සිටින්නේ නම්, මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පලවූ දින සිට මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරන ලෙස මෙයින් දන්වා සිටිමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන් මාවත ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම සුදුසු බවට 2010.03.31 වැනි දින පැවති මහ සභාවේ දී සභා සම්මත කොට ඇති බව ද නිවේදනය කරනු ලැබේ.

ටී. ඩී. ජයතිස්ස,
සභාපති,
රත්තොට ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 24 වැනි දින,
රත්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

*රත්තොට ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස ප්‍රකාශයට පත් කරන මාර්ග පිළිබඳ විස්තර*

| *අංක* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *මාර්ගයේ පටන් ගැන්ම හා අවසානය* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* | *මායිම්* | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | *වමට* | *දකුණට* |
| 1 | ජනක බණ්ඩාර තෙන්නකෝන් මාවත (ප්‍රාදේශීය සභා ප්‍රවිෂ්ඨ මාර්ගය) | රත්තොට | *පටන්ගැන්ම :* මාතලේ-රත්තොට ප්‍රධාන මාර්ගයේ රත්තොටනගරයේ මාතලේ පාරේ අංක 55බී කඩ කාමරය අසලින් ආරම්භ වේ. *අවසානය :* එසේ ආරම්භවන මාර්ගය ඉදිරියට ගොස් රන්ජන් විජේරත්න මාවතට සම්බන්ධ වන ස්ථානයෙන් (ප්‍රාදේශීය සභාව ඉදිරිපිටින්) අවසන්වේ. | මීටර් 110 (අඩි360) | ආරම්භය අඩි 23 ඉදිරියට 23,27,28,29 31 වශයෙන් ද අවසානයේ 24 ක් වශයෙන් ද පවතී | *ආරම්භයේ සිට :* අංක 53 දරන දේපල පල්ලියේ ඉඩම ප්‍රාදේශීය සභාව සතු කඩ කමාර සහිත දෙමහල් ගොඩනැගිල්ල | *ආරම්භයේ සිට :* අංක -55බී-දේපළ අංක -55ඒ-දේපළ අංක-53/15-දේපළ අංක-53/14-දේපළ අංක-53/13-දේපළ අංක-53/12-දේපළ අංක-53/11-1/1-දේපළ අංක-53/11-දේපළ අංක-53/10-දේපළ අංක 53/9-1/1 දේපළ අංක-53/9-දේපළ අංක-53/8-දේපළ අංක-53/7-දේපළ අංක-53/4-සිට අංක-53/6-ප්‍රාදේශීය සභාව සතු ඉඩම |

06-223

---

## වැලිගම නගර සභාව

නගර සභා ආඥා පනෙත් 44(11) වැනි වගන්තිය ප්‍රකාරව පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් වැලිගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා නගර සභා ආඥා පනතේ 44(11) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් නගර සභා ආඥා පනතේ 44(11) වගන්තිය යටතේ උපලේඛනයේ සඳහන් මංමාවත් වල නම් නගර සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන ස්ථිර වශයෙන්ම පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

මොහමඩ් හුසෙයින් හාජියාර් මුහම්මද්,
සභාපති,
වැලිගම නගර සභාව.

2010 මැයි මස 03 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *අංකය* | *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භක ස්ථානය* | *මාර්ගයේ අවසන් ස්ථානය* | *මාර්ගයේ දිග (කි.මී.)* | *මාර්ගයේ පළල (කි.මී.)* |
|---|---|---|---|---|---|
| 01. | අග්‍රබෝධි මාවත | පරණ ගාලු පාර | පාතෙගම | 0.602 | 6.00 |
| 02. | ඒ. පී. දළුවත්ත මාවත | හෙට්ටිවීදිය පාර | බණ්ඩාරනායක මාවත | 0.406 | 2.8 |
| 03. | එරල් ජයවික්‍රම මාවත | හෙට්ටිවීදිය පාර | බණ්ඩාරනායක මාවත | 0.220 | 2.43 |

| *අනු අංකය* | *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භක ස්ථානය* | *මාර්ගයේ අවසන් ස්ථානය* | *මාර්ගයේ දිග (කි.මී.)* | *මාර්ගයේ පළල (කි.මී.)* |
|---|---|---|---|---|---|
| 04. | කුරුඳුවත්ත පාර | පරණ ගාලු පාර | රේල් පාර | 0.300 | 2.74 |
| 05. | බණ්ඩාරනායක මාවත | හෙට්ටිවීදිය පාර | බොරාල පාර | 1.178 | 7.0 |
| 06. | හෙට්ටිවීදිය පළමු පටුමග | හෙට්ටිවීදිය පාර | කෝට්ටගොඩ පාර | 0.298 | 4.6 |
| 07. | පිටිදූව පාර | පරණ ගාලු පාර | මායිම | 0.069 | 4.4 |
| 08. | කෝට්ටගොඩ වතුර ටැංකියට යන පාර 11 වන හරස් පාර | කෝට්ටගොඩ පාර | වතුර ටැංකිය | 0.109 | 3.00 |
| 09. | කෝට්ටගොඩ පළමු හරස් පාර | කෝට්ටගොඩ පාර | සම්බන්ධයක් නැත | 0.267 | 2.00 |
| 10. | හෙට්ටිවීදිය දෙවන පටුමග | හෙට්ටිවීදිය පාර | සම්බන්ධයක් නැත | 0.390 | 3.65 |
| 11. | ගොන්නගහගොඩවත්ත අතුරු මාර්ගය | කෝට්ටගොඩ පාර | සම්බන්ධයක් නැත | 0.289 | 4.50 |
| 12. | කෝට්ටගොඩ පාර | හෙට්ටිවීදිය 1 පටුමග | බොරාල පාර | 0.390 | 3.65 |
| 13. | ගොඩේවලව්වත්ත පාර | බණ්ඩාරනායක මාවත | සම්බන්ධයක් නැත | 0.43 | 3.00 |
| 14. | ගොඩේවලව්වත්ත අතුරුපාර | ගොඩේවලව්වත්ත පාර | සම්බන්ධයක් නැත | 0.68 | 3.00 |
| 15. | ජින්නා පාර | අකුරැස්ස තෙලිජ්ජවිල පාර | බොරාල පාර | 0.623 | 4.65 |
| 16. | කොහුණුගමුව පාර | අකුරැස්ස තෙලිජ්ජවිල පාර | පලල්ල පාර | 0.968 | 3.96 |
| 17. | සමඟි මාවත | බොරාල පාර | ජින්නා පාර | 0.327 | 5.4 |
| 18. | පොල්කඳන් ඇළ පාර | ජින්නා පාර | කොහුණුගමුව තුංමන් හන්දිය (බුදුපිළිමය) | 0.414 | 3.6 |
| 19. | කොහුණුගමුව පාසල් පටුමග | කොහුණුගමුව පර | අරෆා විද්‍යාලය | 0.143 | 5.0 |
| 20. | පලල්ල පාර | තෙලිජ්ජවිල අකුරැස්ස පාර | නගර සභා සීමාවෙන් අවසන් | 0.234 | 4.8 |
| 21. | පුබුදු ජය මාවත | කොහුණුගමුව පාර | සම්බන්ධයක් නැත | 0.310 | 2.43 |
| 22. | පට්ටනිය වත්ත පාර (අතුරු මාර්ග ඇතුලුව) | කොහුණුගමුව පාර | සම්බන්ධයක් නැත | 0.484 | 2.43 |
| 23. | විජයරත්හේන මාර්ගය | බණ්ඩාරනායක මාවත | මායිම | 0.503 | 3.60 |
| 24. | වැල්ලක්ක වටවලගොඩ හේන කෘෂිකාර්මික පාර | බොරාල පාර | මායිම | 0.3 | 3.00 |
| 25. | වැල්ලක්ක වටවලගොඩ හේන 1 වන අතුරු පාර | වැල්ලක්ක වටවලගොඩහේන කෘෂිකාර්මික පාර | සම්බන්ධයක් නැත | 0.2 | 3.00 |
| 26. | පැලැන 1 වන පටුමග | පරණ ගාලු පාර | නව ගාලු පාර | 0.160 | 4.00 |
| 27. | පැලැන පොල්වත්ත පාර | පොල්වත්ත ප්‍රධාන පාර | ගංගාරාම පාර | 0.304 | 2.43 |
| 28. | ජංකලපුවත්ත පාර | නව ගාලු පාර | පරණ ගාලු පාර | 0.322 | 5.00 |
| 29. | විජය කුමාරතුංග මාවත | පරණ ගාලු පාර | රේල් පාරෙන් අවසන් | 0.2 | 3.00 |
| 30. | ආවාස පාර | පරණ ගාලු පාර | රේල් පාර | 0.358 | 2.40 |
| 31. | පැලැන ගංගාරාම පාර | පරණ ගාලු පාර | පරණ ගාලු පාර | 0.669 | 4.10 |
| 32. | ගංගාරාම පාර 1 වන පටුමග | ගංගාරාම පාර | රේල් පාරෙන් අවසන්වේ. | 0.283 | 4.00 |
| 33. | ගංගාරාම අතුරු මාර්ග | පැලැන ගංගාරාම පාර | පොල්වත්ත පාර | 0.4 | 2.44 |
| 34. | වෙරළ පාර | පරණ ගාලු පාර | අළුත් පාර | 0.177 | 8.4 |
| 35. | රාජකුලවඩන රජමහ පාර | පරණ ගාලු පාර | හෙට්ටිවීදිය පාර | 0.180 | 2.60 |
| 36. | ශ්‍රී සද්ධාවාස නාහිමි පාර | පරණ ගාලු පාර | අග්‍රබෝධි පාර | 0.107 | 2.59 |
| 37. | ශ්‍රී සද්ධානන්ද නාහිමි මාවත | පරණ ගාලු පාර | හෙට්ටිවීදිය පාර | 0.210 | 7.00 |
| 38. | මහවීදිය බෝගහවත්ත පාර | පරණ ගාලු පාර | නව ගාලු මාර්ගය | 0.210 | 3.3 |
| 39. | ධීවර විවේකාගාරයට යන පාර (පරණකඩේ 111 පටුමග) | පරණ ගාලු පාර | නව ගාලු මාර්ගය | 0.157 | 4.57 |
| 40. | සද්ධානන්ද මාවත පළමු හා දෙවන හරස් පාරවල් | ශ්‍රී සද්ධානන්ද නාහිමි මාවත | සම්බන්ධයක් නැත | 0.174 | 4.50 |
| 41. | සමරවීර පෙදෙස සිට ප්‍රධාන හරස් පාරට | සමරවීර දෙවන හරස් පාර | සිරිමාවෝ බණ්ඩාරනායක මාවත | 0.149 | 3.65 |

| අනු අංකය | මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භක ස්ථානය | මාර්ගයේ අවසන් ස්ථානය | මාර්ගයේ දිග (කි.මී.) | මාර්ගයේ පළල (කි.මී.) |
|---|---|---|---|---|---|
| 42. | සමරවීර චතුරස්‍රයේ පළමු හරස් පාර | පරණ ගාලු පාර | අළුත් පාර | 0.099 | 3.65 |
| 43. | සමරවීර චතුරස්‍රයේ දෙවන හරස් පාර | පරණ ගාලු පාර | අළුත් පාර | 0.117 | 3.65 |
| 44. | සමරවීර චතුරස්‍රයේ තුන්වන හරස් පාර | පරණ ගාලු පාර | අළුත් පාර | 0.121 | 3.65 |
| 45. | සමරවීර චතුරස්‍රයේ හතරවන හරස් පාර (පරණකඩේ) | පරණ ගාලු පාර | අළුත් පාර | 0.106 | 3.65 |
| 46. | පරණකඩේ 1 පටුමග (ප්‍රා.ලේ.කා. අසල පාර) | නව ගාල්ල පාර | සමබ්න්ධයක් නැති | 0.195 | 2.43 |
| 47. | ජය මාවත | පරණ ගාලු පාර | නව ගාලු පාර | 0.420 | 7.5 |
| 48. | සිරිකතපුර පාර | පරණ ගාලු පාර | හෙට්ටිවීදිය පාර | 0.166 | 2.43 |
| 49. | වැල්ලවත්ත පාර | පරණ ගාලු පාර | නව අතුරු මාර්ගය | 0.102 | 3.4 |
| 50. | ඩිමෝනි පාර | පරණ ගාලු පාර | නව අතුරු මාර්ගය | 0.105 | 4.00 |
| 51. | අයි. එල්. මොහොමඩ් මාවත | බදූර් ලේන් | අකුරැස්ස පාර | 0.285 | 2.74 |
| 52. | දංකලපුවත්ත පාර හා අතුරු මාර්ග | ජයවිකුම්ගම පාර | සම්බන්ධයක් නැත | 0.33 | 2.40 |
| 53. | ජයවිකුම්ගම 1 වන පටුමග | ජයවිකුම්ගම පාර | සම්බන්ධයක් නැත | 0.129 | 4.57 |
| 54. | අළුත්වීදිය සදාසරණ මාවත | අකුරැස්ස පාර | සදාසරණ පල්ලිය | 0.125 | 4.57 |
| 55. | සමාන්තර පාර (අරුෂියා මාවත) | තෙලිජ්ජවිල අකුරැස්ස පාර | තෙලිජ්ජවිල අකුරැස්ස පාර | 0.125 | 3.2 |
| 56. | මලපලාව නිවාස යෝජනා ක්‍රම පාර | කොහුණුගමුව පාර | අකුරැස්ස පාර | 0.221 | 3.35 |
| 57. | මලපලාව I වන හරස් පාර | මලපලාව ප්‍රධාන පාර | සම්බන්ධයක් නැත | 0.059 | 3.00 |
| 58. | මලපාලව II වන හරස් පාර | මලපලාව ප්‍රධාන පාර | සම්බන්ධයක් නැත | 0.067 | 3.00 |
| 59. | මලපලාව III වන හරස් පාර | මලපලාව ප්‍රධාන පාර | සම්බන්ධයක් නැත | 0.044 | 3.00 |
| 60. | මලපලාව IV වන හරස් පාර | මලවලාව ප්‍රධාන පාර | සම්බන්ධයක් නැත | 0.056 | 3.00 |
| 61. | මලපලාව V වන හරස් පාර | මලපලාව ප්‍රධාන පාර | සම්බන්ධයක් නැත | 0.05 | 3.00 |
| 62. | අරුෂියා මාවත පළමු හරස් පාර | අරුෂියා මාවත | සම්බන්ධයක් නැත | 0.175 | 3.00 |
| 63. | ඇෂියා මාවත දෙවන හරස් පාර | අරුෂියා මාවත | සම්බන්ධයක් නැත | 0.175 | 3.00 |
| 64. | අළුත්වීදිය පළමු හරස් පාර | අකුරැස්ස පාර | පොල්වත්ත ගඟ | 0.157 | 3.00 |
| 65. | අරුෂියා මාවත තුන්වන හරස් පාර | අරුෂියා මාවත | සම්බ්න්ධයක් නැත | 0.30 | 3.60 |
| 66. | බටකැටිය කන්ද පාර | බටකැටිය පාර | තල්කොටහේන පාර | 0.451 | 1.82 |
| 67. | කප්පරතොට ඇවරියවත්ත පාර | සංඝානන්ද පාර | වෙරළ | 1.34 | 3.00 |
| 68. | කප්පරතොට ඇවරියවත්ත 1 වන හරස් පාර | ඇවරියවත්ත පාර | වෙරළ | 0.152 | 2.74 |
| 69. | ඇවරියවත්ත දෙවන පටුමග | ඇවරියවත්ත පාර | වෙරළ | 0.167 | 3.00 |
| 70. | පන්සලවත්ත පාර | නව ගාලු පාර | සංඝානන්ද පාර | 0.227 | 5.4 |
| 71. | මාරගහවත්ත පාර | සංඝානන්ද මාවත | පන්සලවත්ත පාර | 0.120 | 3.00 |
| 72. | එරමුදුගහවත්ත පාර | සංඝානන්ද පාර | සම්බන්ධයක් නැත | 0.180 | 5.00 |
| 73. | කප්පරතොට රාක්ෂමුනු කන්ද පාර | සංඝානන්ද පාර | වෙරළ | 0.240 | 4.00 |
| 74. | වල්ලිවල පළමු පටුමග | නව ගාලු පාර | කප්පරතොට සංඝානන්ද පාර | 0.339 | 5.00 |
| 75. | ගල්ගෙඩිගහවත්ත පාර | මහ නැවියා පාර | නව ගාලු මාර්ගය | 0.247 | 5.3 |
| 76. | ඉහළ දෙනිය පාර | නව අතුරු මාර්ගය | සංඝානන්ද පාර | 0.334 | 3.65 |
| 77. | ඇලෙන් එගොඩවත්ත පාර | සංඝානන්ද පාර | සම්බන්ධයක් නැත | 0.165 | 5.00 |

| අංකය | මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භක ස්ථානය | මාර්ගයේ අවසන් ස්ථානය | මාර්ගයේ දිග (කි.මී.) | මාර්ගයේ පළල (කි.මී.) |
|---|---|---|---|---|---|
| 78. | නාරා ආයතනයට යන පාර | සංඝානන්ද පාර | වෙරළ | 0.106 | 3.65 |
| 79. | බටකැටිය පාර | ගාල්ල මාතර ප්‍රධාන පාර | වෙරළ | 0.420 | 6.00 |
| 80. | දංකලපුවත්ත ධීවර පාර | ජය මාවත පාර | සම්බන්ධයක් නැත | 0.156 | 4.00 |
| 81. | බණ්ඩරවත්ත පාර | සංඝානන්ද පාර | වෙරළ | 0.150 | 4.00 |
| 82. | පිටහේනවත්ත පාර | සංඝානන්ද පාර | සම්බන්ධයක් නැත | 0.097 | 2.8 |
| 83. | බරණසූරියවත්ත පාර | පරණ ගාලු පාර | සම්බන්ධයක් නැත | 0.4 | 3.00 |
| 84. | ඩොල්සන්තෝට්ටම් පාර | මොහමඩ් ලේන් | සම්බන්ධයක් නැත | 0.088 | 5.0 |
| 85. | මොහොමඩ් ලේන් | බුහාරිමස්ජිඩ් මාවත | සම්බන්ධයක් නැත | 0.340 | 3.3 |
| 86. | බදුර්ලේන් | අකුරැස්ස තෙලිජ්ජවිල පාර | අකුරැස්ස තෙලිජ්ජවිල පාර | 0.194 | 3.4 |
| 87. | ගල්මුල්ල පටුමග | මොහොමඩ් ලේන් පාර | බුහාරි මස්ජිඩ් පාර | 0.098 | 5.4 |
| 88. | වජිරඥාණ මාවත | දුම්රියපල | බුහාරි මස්ජිද් මාවත | 0.654 | 6.0 |
| 89. | වජිරඥාණ මාවත 1 වන අතුරු පාර | වජිරඥාණ මාවත | සම්බන්ධයක් නැත | 0.216 | 3.0 |
| 90. | කොරටුවගෙදර පළමු පටුමග | වජිරඥාණ මාවත | සම්බන්ධයක් නැත | 0.106 | 2.74 |
| 91. | කොරටුවගෙදර දෙවන පටුමග | කොරටුව ගෙදර පළමු පටුමග | සම්බන්ධයක් නැත | 0.109 | 2.74 |
| 92. | ටී. එල්. පටුමග | ගල්බොක්ක පාර (අකුරැස්ස පාර) | සම්බන්ධයක් නැත | 0.1 | 2.8 |
| 93. | බුහාරි පල්ලිය පාර (ගුඩ්ෂෙඩ් පාර) | බුහාරි මස්ජිද් මාවත | සම්බන්ධයක් නැත | 0.25 | 4.5 |
| 94. | ජිනේන්ද්‍රාරාම පාර | පරණ ගාලු පාර | පිටිදූව පාර (මායිම්) | 0.200 | 4.6 |
| 95. | ජිනේන්ද්‍රාරාම පාර 1 වන හරස් පාර | ජිනේන්ද්‍රාරාම පාර | සම්බන්යක් නැත | 0.064 | 3.00 |
| 96. | සංඝානන්ද මාවත | පරණ ගාලු පාර | නව ගාලු පාර | 0.6 | 3.0 |
| 97. | ජයරළපුර පාර | පරණ ගාලු පාර | රබිනෙල්ගෙවත්ත පාර | 0.660 | 3.00 |
| 98. | ගොඩඉහළ පාර | පරණ ගාලු පාර | සම්බන්ධයක් නැත | 0.299 | 4.57 |
| 99. | කුරුඳුවත්ත 1 වන හරස් පාර | කුරුඳුවත්ත පාර | සම්බන්ධයක් නැත | 0.053 | 3.00 |
| 100. | වැල්ලක්ක සමුපකාරය අසල අතුරුපාර | බොරාල පාර | සම්බන්ධයක් නැත | 0.247 | 2.59 |
| 101. | මහවෙල ගෙදර පාර | පරණ ගාලු පාර | සංඝානන්ද පාර | 0.210 | 3.00 |
| 102. | වැලිකනත්ත පාර | මහනැවියා උයන පාර | කුරුඳුවත්ත පාර | 0.381 | 3.04 |
| 103. | ශ්‍රී විජයාරාම පාර | පරණ ගාලු පාර | සංඝානන්ද පාර | 0.575 | 6.00 |
| 104. | රබිනෙල්ගෙවත්ත පාර | පිටිදූව පාර | ජිනේන්ද්‍රාරාම පාර | 1.457 | 4.50 |
| 105. | මහනැවියා උයන පාර | පැරණි ගාලු පාර | සම්බන්ධයක් නැත | 0.65 | 3.50 |
| 106. | සෝමහිමි මාවත | මහනැවියා පාර | පරණ ගාලු පාර | 0.150 | 6.70 |
| 107. | බටවලකන්ද පාර | පාතෙගම පාර | සම්බන්ධයක් නැත | 0.183 | 4.7 |
| 108. | කළුකන්ද පාර | නව ගාලු පාර | මුහුද | 0.038 | 3.00 |
| 109. | පැණිදොඩම්වත්ත පාර හා අතුරු මාර්ග | බටවල පාතෙගම පාර | සම්බන්ධයක් නැත | 0.250 | 4.0 |
| 110. | මාහේන නිවාස යෝජනා ක්‍රමය පාර | විජයාරාම පාර | සම්බන්ධයක් නැත | 1.5 | 3 |
| 111. | අද්දරවත්ත පාර | පරණ ගාලු පාර | සම්බන්ධයක් නැත | 0.180 | 3.6 |
| 112. | ඉහළ වඩුගෙවත්ත පාර | පරණ ගාලු පාර | නිවස | 0.1 | 3 |
| 113. | කෝපිවත්ත පාර | පරණ ගාලු පාර | සම්බන්ධයක් නැත | 01. | 2.4 |
| 114. | රළගම අතුරු මාර්ග (ජයරළපුර) | ජයරළපුර ප්‍රධාන පාර | සම්බන්ධයක් නැත | 1.0 | 3 |
| 115. | තල්කොටහේන පාර | නව ගාලු පාර | සම්බන්ධයක් නැත | 0.032 | 2.8 |
| 116. | හේනවත්ත පාර | නව ගාලු පාර | සම්බන්ධයක් නැත | 0.09 | 3.0 |
| 117. | කුඩළුමුල්ල පාර | බටවල පාතෙගම පාර | සම්බන්ධයක් නැත | 0.365 | 3.35 |
| 118. | කොස්වත්ත පාර | අග්‍රබෝධි පාර | අග්‍රබෝධි පාර | 0.2 | 2.4 |
| 119. | ජය මාවත | පරණ ගාලු පාර | නව ගාලු පාර | 0.3 | 2.0 |
| 120. | අභිමානගම පාර (අභ්‍යන්තර මාර්ග) | නව ගාලු පාර | සම්බන්ධයක් නැත | 0.134 | 2.0 |
| 121. | උඩකන්ද වත්ත පාර | පරණ ගාලු පාර | සම්බන්ධයක් නැත | 0.210 | 3.4 |
| 122. | මහනැවියා පාර | පරණ ගාලු පාර | වෙරළ | 1.305 | 6.00 |

# විවිධ දැන්වීම්

## පදවිය ප්‍රාදේශීය සභාව

2010 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය යටතේ පදවිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2009 වර්ෂයේ නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. චමින්ද කැළුම් අබේසේකර,
සභාපති,
පදවිය ප්‍රාදේශීය සභාව.

2009 ක්වූ නොවැම්බර් මස 24 වැනි දින,
පදවිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ පනතේ විධිවිධාන යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි උපලේඛණයේ 1 වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා පදවිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ දී නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් මෙහි උපලේඛණයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකල යුතු යැයි යෝජනා කරමි.

*උපලේඛණය*

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු අංකය* | *බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු.750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු.1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 01. | ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 03. | බත් කඩයක් පැවැත්වීම | 500 0 | 600 0 | 800 0 |
| 04. | තේ කඩයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 |
| 05. | ආපනශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 06. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | කිරි විකිණීම | 500 0 | 700 0 | 1,000 0 |
| 08. | මාළු විකිණීම | 500 0 | 600 0 | 700 0 |
| 09. | මස් විකිණීම | 500 0 | 600 0 | 700 0 |
| 10. | ගව ගාලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 700 0 |
| 11. | සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 |
| 13. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 14. | කොණ්ඩ සැකසීමේ සැලුන් හලක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |
| 15. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |

එසේ වුව ද, යම් පරිශ්‍රයක් හෝටලයක ආපන ශාලාවක හෝ නවාතැන් පොළක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නා වූද 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා එම හෝටලය ආපන ශාලාව හෝ නවාතැන් පොළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, අනුමත කර හෝ පිළිගත්තා වූද අවස්ථාවක බලපත්‍ර ගාස්තු 2009 වර්ෂයේ ඒ හෝටලයේ ආපන ශාලාවේ හෝ නවාතැන් පොළෙහි ආදායමෙන් 1% ක් විය යුතුය.

06-224/1

## පදවිය ප්‍රාදේශීය සභාව

2010 වර්ෂයට වාහන හා සත්ව බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය සමඟ කියවිය යුතු ඒ පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ පදවිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2009 වර්ෂයේ නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. චමින්ද කැළුම් අබේසේකර,
සභාපති,
පදවිය ප්‍රාදේශීය සභාව.

2009 ක් වූ නොවැම්බර් මස 24 වැනි දින,
පදවිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය සමඟ කියවිය යුතු ඒ පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ පදවිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සෑම වාහනයක් සහ සතෙක් වෙනුවෙන්ම මෙහි උපලේඛණයේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2010 වර්ෂයේ දී පනවා අය කල යුතු යැයි යෝජනා කරමි.

*උපලේඛණය*

| | | *රු. ශත* |
|---|---|---|
| මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, ජීප් රික්ෂෝවක්, කරත්තයක්, මෝටර් බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම | | 25 0 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා | | |
| *(අ)* | වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| *(ආ)* | වෙළඳ කාර්යයන් සඳහා නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| සෑම කරත්තයක් සඳහා | | 20 0 |
| සෑම අත් කරත්තයක් සඳහා | | 10 0 |
| සෑම රික්ෂෝවක් සඳහා | | 7 50 |
| සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | | 15 0 |
| සෑම ඇතෙකු සඳහා | | 50 0 |

විෂ්කම්භය 26" නොඉක්මවන රෝද ඇති ළමා වාහන, විල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථාන වල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛණයේ වෙළඳ කාර්යය යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුලත් වේ.

06-224/3

---

## පදවිය ප්‍රාදේශීය සභාව

2010 වර්ෂයට කර්මාන්ත බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ පදවිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2009 වර්ෂයේ නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. චමින්ද කැළුම් අබේසේකර,
සභාපති,
පදවිය ප්‍රාදේශීය සභාව.

2009 ක් වූ නොවැම්බර් මස 24 වැනි දින,
පදවිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පදවිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි උපලේඛණයේ 1 වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් මෙම උපලේඛණයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයේ බද්දක් 2010 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

*උපලේඛණය*

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු.750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු.1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 01. | වී මෝල් | 500 0 | 700 0 | 1,000 0 |
| 02. | ගඩොල් කපන ස්ථානයක් | 500 0 | 700 0 | 1,000 0 |
| 03. | වැල්ඩින් වැඩපොලක් | 500 0 | 700 0 | 1,000 0 |
| 04. | වඩු මඩු | 300 0 | 700 0 | 1,000 0 |
| 05. | කළු ගල් කඩන ස්ථානයක් | 500 0 | 700 0 | 1,000 0 |
| 06. | ඇඹරුම්හල | 500 0 | 700 0 | 1,000 0 |
| 07. | පා පැදි අළුත්වැඩියාව | 400 0 | 700 0 | 1,000 0 |
| 08. | ලී වෙළඳසැල් | 500 0 | 700 0 | 1,000 0 |
| 09. | ගෘහ භාණ්ඩ අලෙවිසැල් | 500 0 | 700 0 | 1,000 0 |
| 10. | යකඩ කම්හල් | 300 0 | 700 0 | 1,000 0 |

06-224/2

**පදවිය ප්‍රාදේශීය සභාව**

2010 වර්ෂයට ව්‍යාපාර බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ පදවිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2009 වර්ෂයේ නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඒ. චමින්ද කැළුම් අබේසේකර,
සභාපති,
පදවිය ප්‍රාදේශීය සභාව.

2009 ක් වූ නොවැම්බර් මස 24 වැනි දින,
පදවිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ පදවිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් පදවිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2010 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2009 වර්ෂයේ ආදායම මෙහි උපලේඛණයේ 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි 11 වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව බද්දක් 2010 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

***උපලේඛණය***

| | *1 වන තීරුව*<br>*2009 වර්ෂයේ දී ව්‍යාපාර ආදායම* | *11 වන තීරුව*<br>*රු. ශත* |
|---|---|---|
| 01. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 02. | රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| 03. | රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| 04. | රු. 18, 750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| 05. | රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| 06. | රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

06-224/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.